ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

# පරීක්ෂක වාර්තාව

AA1 විභාගය - ජනවාරි 2018

## (AA11) මූල්‍ය ගිණුම්කරණ මූලිකයන්

(Financial Accounting Basics)

---

## A - කොටස

වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න

**ප්‍රශ්න අංක 01 - ලකුණු 40**
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

මෙම ප්‍රශ්නය අනු ප්‍රශ්න 16 කින් සමන්විතය. විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට උත්තර සපයා තිබුණද සමහරු ප්‍රශ්න පත්‍රයේ දී තිබූ උපදෙස් හරිහැටි පිළිපැද නොතිබූ බව දක්නට ලැබුණි. ප්‍රශ්න අංක 1.1 සිට 1.8 දක්වා වූ ප්‍රශ්න සඳහා සපයා තිබූ උත්තර, උත්තර පොතේ සටහන් කළයුතු වුවද එම උපදෙස් සැලකිල්ලට නොගෙන සමහරු ප්‍රශ්න පත්‍රයේම උත්තර සටහන් කර එය උත්තර පොතට අමුණා තිබෙනු දක්නට ලැබුණි.

තවත් සමහරු අංක 1.9 සිට 1.16 දක්වා වූ ප්‍රශ්න සඳහා උත්තර අදාල උත්තර පොතේ ලියා තිබුණද ප්‍රශ්න අංක 1.1 සිට 1.8 දක්වා වූ ප්‍රශ්න සඳහා උත්තර ලියා නොතිබුණි. ලෙහෙසියෙන් ලකුණු රැස්කරගත හැකිව තිබූ මෙම ප්‍රශ්න සඳහා උත්තර ප්‍රශ්න පත්‍රයේම සටහන් කර උත්තර පොතෙහි සටහන් කිරීමට අමතකවූවා විය හැකිය.

අනු කොටස්වලට දී තිබූ උත්තර අනුව පොදුවේ දක්නට ලැබුනු වැරදි / දුර්වලතා කිහිපයක් පහත දැක්වේ:

**ප්‍රශ්න අංක 1.2**

මෙම ප්‍රශ්නය සඳහා නිවැරදි උත්තර අංක (1) උපචිත සංකල්පය වුවද, ගිණුම්කරණ සංකල්පය පිළිබඳ දැනුම අඩු බොහෝ පිරිසක් අංක (3) අස්තිත්ව (Entity) සංකල්පය නිවැරදි උත්තරය වශයෙන් සටහන් කර තිබුණි.

**ප්‍රශ්න අංක 1.3**

මූලාශ්‍ර ලියවිලි පිළිබඳ බොහෝ පිරිසකගේ දැනුම අඩු මට්ටමක පවතී. නිවැරදි උත්තරය (1) ගැනුම් ඇණවුම වුවද වැඩි පිරිසක් අංක (4) ගැනුම් ඉන්වොයිසිය ලෙස සටහන් කර තිබුණි.

**ප්‍රශ්න අංක 1.8**

ගිණුම්කරණ මෘදුකාංග පැකේජයන් පිළිබඳ පැහැදිලි අවබෝධයක් බොහෝ පිරිසකට නොමැතිකමින් නිවැරදි උත්තරය වන (2) ක්වික් බුක් (Quick book) වෙනුවට වෙනත් වැරදි උත්තර සපයා තිබුණි.

**ප්‍රශ්න අංක 1.9**

අඛණ්ඩ පැවැත්ම පිළිබඳ සංකල්පය වෙනුවට සමහරු අස්තිත්ව (Entity) සංකල්පය පිළිබඳව පැහැදිලිකර තිබෙනු දක්නට ලැබුණි.

**ප්‍රශ්න අංක 1.14**

මෙම ප්‍රශ්නය සඳහා බොහෝ පිරිසක් වැරදි උත්තර සපයා තිබුණි. විකුණුම් පිරිවැය නිවැරදිව ගණනය කිරීමට නොදත්කම මීට හේතුසාධක වශයෙන් දැක්විය හැකිය.

**ප්‍රශ්න අංක 1.15**

අදාල ගනුදෙනු සඳහා නිවැරදි ද්විත්ව සටහන් අපේක්ෂා කළද, සමහර අයදුම්කරුවන් ඒ සඳහා ලෙජර් ගිණුම් ඉදිරිපත් කර තිබෙනු දක්නට ලැබුණි. තවත් සමහරු ද්විත්ව සටහන ඉදිරිපත් කර තිබුණද ඊට අදාල අගයන් සටහන් කර නොතිබුණි. ද්විත්ව සටහනෙහි එක් සටහනක් පමණක් දක්වා තිබුණු අවස්ථාද විය.

## B - කොටස

**ප්‍රශ්න අංක 02 - ලකුණු 10**
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

කේවලස්වාමි ව්‍යාපාරයක ශේෂ පිරික්සුම පිළියෙල කිරීම පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම සඳහා මෙම ප්‍රශ්නය ඉදිරිපත් කර ඇත.

උත්තර ඇගයීමේදී පොදුවේ දක්නට ලැබුණු දුර්වලතා කිහිපයක් පහත දැක්වේ:

(1) ශේෂ පිරික්සුම පිළිබඳ මූලික දැනුම නොමැතිකමින් සමහරු ඒ සඳහා ශේෂ පත්‍රය පිළියෙල කර තිබෙනු දක්නට ලැබුණි.

(2) ව්‍යාපාරය ඇරඹීම සඳහා ආරම්භක ආයෝජනය වූ රු.1,000,000/- ක මුදල, ආරම්භක ප්‍රාග්ධනය වුවද සමහරු එම ආයෝජනය වත්කමක් ලෙස සලකා ශේෂ පිරික්සුමේ හරට සටහන්කර තිබෙනු දක්නට ලැබුණි.

(3) වෙළෙඳ ණයගැති සහ ණයහිමි පාලන ගිණුම් සැදීම පිළිබඳ අවබෝධය නොමැතිකමින් සමහර අයදුම්කරුවන් එම ගිණුම් ආශ්‍රයෙන් නිවැරදි විකුණුම් සහ ගැනුම් අගයන් සොයා ගැනීමට අපොහොසත් වී ඇති බව දක්නට ලැබුණි. දී ඇති අවසාන ශේෂයන් සහ මුදල් පොතෙහි දක්වා ඇති ගනුදෙනු ගලපමින් විකුණුම් සහ ගැනුම් ගණනය කිරීමට අයදුම්කරුවන් තුළ අවබෝධය වර්ධනය කරගත යුතුය.

(4) සාප්පු කුලී සහ විදුලි බිල්පත්වලට අදාල ඉදිරියට ගෙවූ සහ උපචිත වියදම් නිවැරදිව ගලපා ගැනීමටත් ඒවා ශේෂ පිරික්සුම තුල සටහන් කිරීමටත් සමහර අයදුම්කරුවන්ට අපහසු වී ඇති බව දක්නට ලැබුණි.

**ප්‍රශ්න අංක 03 - ලකුණු 10**
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

මෙම ප්‍රශ්නය (a) සහ (b) වශයෙන් කොටස් දෙකකින් සමන්විත වන අතර, (a) කොටසින් වැරදි නිවැරදි කිරීමට අදාල ජර්නල් සටහන් සහ (b) කොටසින් අවිනිශ්චිත ගිණුම පිළියෙල කිරීම පිළිබඳ දැනුම පරීක්ෂාවට ලක්කර ඇත.

මෙම කොටස් දෙක සඳහා උත්තර ඇගයීමේදී පොදුවේ දක්නට ලැබුණු දුර්වලතා කීපයක් පහත දැක්වේ:

**(a) <u>වැරදි නිවැරදි කිරීමේ ජර්නල් සටහන් පිළියෙල කිරීම</u>**

(1) ප්‍රශ්නය හරිහැටි අවබෝධ කර නොගත් සමහරු ජර්නල් සටහන් වෙනුවට ලෙජර් ගිණුම් පිළියෙල කිරීමෙන් කාලය අනවශ්‍ය ලෙස අපතේ යවා තිබුණි.

(2) තවත් සමහර අයදුම්කරුවන් හරට සටහන් කළ යුතු සටහන් බැරටත්, බැරට සටහන් කළ යුතු ඒවා හරටත් සටහන් කර ඇත.

(3) මෙම ප්‍රශ්නයේ අයිතම් අංක 4 හි සඳහන් ගනුදෙනුවට අදාලව අවිනිශ්චිත ගිණුම රු.40,000/- කින් හර කිරීම බොහෝ පිරිසක් නිවැරදිව කර තිබුණද, ඊට අදාල බැර සටහන වශයෙන් මුළු අගය වන රු.40,000/- ම පොලී ආදායම් ගිණුමට බැරකර තිබූ අතර, සමහරු පොලී වියදම් ගිණුමට මුළු අගයම වැරදි ලෙස බැර කර තිබෙනු දක්නට ලැබුණි. සමහර අයදුම්කරුවන් මෙම ගනුදෙනුව සඳහා අවිනිශ්චිත ගිණුම උපයෝගී කර නොගෙන වැරදි ලෙස පොලී අදායම් හා පොලී වියදම් ගිණුම් අතර, ගැලපීමට උත්සාහාගෙන තිබෙනු දක්නට ලැබුණි.

(b) <u>අවිනිශ්චිත ගිණුම</u>

(1) අවිනිශ්චිත ගිණුම පිළියෙල කිරීම පිළිබඳව සමහරුන්ට අවබෝධයක් නොමැති බව දක්නට ලැබුණි. ඒ අය අවිනිශ්චිත ගිණුම අතහැර ජර්නල් සටහන් පමණක් පිළියෙල කර තිබුණි.

(2) අවිනිශ්චිත ගිණුමේ හර ශේෂය වූ රු.700,000/- ක් සමහරු එම ගිණුමේ බැර පැත්තේ සටහන් කර තිබුණි.

(3) අවිනිශ්චිත ගිණුමට අදාල හර සටහන් සමහරු එම ගිණුමේ බැර පැත්තේද, බැර සටහන් එම ගිණුමේ හර පැත්තේද වශයෙන් පැති මාරුකර සටහන් කර තිබෙනු දක්නට ලැබුණි.

(4) සමහර අයදුම්කරුවන් අවිනිශ්චිත ගිණුමෙහි හර ශේෂය රු.700,000/- ක් සටහන් නොකර ජර්නල් සටහන්වලට අදාල ශේෂ පමණක් අවිනිශ්චිත ගිණුමෙහි සටහන් කොට තිබුණි.

## ප්‍රශ්න අංක **04** - ලකුණු 10
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

නිෂ්පාදන ගිණුම පිළියෙල කිරීම පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම සඳහා මෙම ප්‍රශ්නය ඉදිරිපත් කර ඇත. උත්තර පත්‍ර පරීක්ෂා කිරීමේදී පොදුවේ දක්නට ලැබුනු දුර්වලතා සහ වැරදි කිහිපයක් පහත දැක්වේ:

(1) නිෂ්පාදන ගිණුමේ ආකෘතිය පිළිබඳ පැහැදිලි අවබෝධයක් නොමැති සමහරුන් එය ආදායම් වියදම් ගිණුමක ස්වරූපයෙන් ද තවත් සමහරු ශේෂ පත්‍රයක ස්වරූපයෙන්ද පිළියෙල කර තිබෙනු දක්නට ලැබුණි.

(2) නොනිමි වැඩ, ප්‍රාථමික පිරිවැයට අගය කළ යුතු බව ප්‍රශ්න පත්‍රයේ පැහැදිලිව සඳහන් කර තිබුණද එය සැලකිල්ලට නොගත් සමහරු නිෂ්පාදන ගිණුමේ අවසානයට නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය යටතේ එය සඳහන් කර තිබුණි.

(3) කළමණාකරුගේ කර්මාන්ත ශාලාවට සම්බන්ධ වැටුප පොදුකාර්ය පිරිවැය යටතේ සටහන් කළ යුතු වුවද සමහරු එය සෘජු වියදමක් ලෙස සලකා ප්‍රාථමික පිරිවැය යටතේ සටහන් කර තිබුණි.

(4) නිෂ්පාදනය කරන සෑම දැව මේසයකටම ගෙවනු ලබන දිරි දීමනාව නිවැරදිව ගණනය කිරීමට සමහරු අපොහොසත් වී ඇති අතර, එහි අගය සෘජු වියදමක් ලෙස සලකා ප්‍රාථමික පිරිවැය යටතේ සටහන් කළ යුතු වුවද සමහරු එය පොදුකාර්ය පිරිවැය යටතේ සටහන් කර තිබුණි.

(5) සමහර අයදුම්කරුවන් ගොඩනැගිලි කුලියෙහි කර්මාන්තශාලාවට අදාල කොටස පොදුකාර්ය පිරිවැයට ගලපනු වෙනුවට මුළු ගොඩනැගිලි කුලියම වැරදි ලෙස නිෂ්පාදන ගිණුමෙහි නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය යටතේ දක්වා තිබූ අවස්ථා නිරීක්ෂණය විය.

## ප්‍රශ්න අංක **05** - ලකුණු 10
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

මෙම ප්‍රශ්නය (A) සහ (B) වශයෙන් කොටස් දෙකකින් සමන්විත වන අතර, (A) කොටසින් ගිණුම්කරණ සමීකරණයට වන බලපෑම සහ (B) කොටසින් දෛනික විකුණුම් පොත පිළියෙල කිරීම පිළිබඳ දැනුම පරීක්ෂාවට ලක්කර ඇත. දී තිබූ උත්තර අනුව පොදුවේ දක්නට ලැබුණු දුර්වලතා පහත දැක්වේ:

(A) <u>ගිණුම් සමීකරණයට වන බලපෑම</u>

(1) ගිණුම්කරණ සමීකරණ පිළිබඳ පැහැදිලි අවබෝධයක් සමහරුන්ට නොමැති බව දක්නට ලැබුණි. සමහරු ගනුදෙනුවල අගයන් (+) (-) ලකුණු රහිතව සටහන් කර තිබුණි.

(2) නැවත විකිණීම සඳහා ණයට මිලදීගත් රු.650,000/- ක් වූ භාණ්ඩ සමහරු අත්පිට මිලදී ගැනීමක් ලෙස සලකා තොග තීරයේ + 650,000 ක් සහ මුදල් තීරයේ - 650,000 ක් ලෙස සටහන් කර තිබුණි. තවත් සමහරු එම ගනුදෙනුව ණයට විකිණීමක් ලෙස සලකා තොග තීරයේ - 650,000 ක් සහ ණයගැතියෝ තීරයේ + 650,000 ක් ලෙස සටහන් කර තිබුණි.

(3) සමහර අයදුම්කරුවන් අයිතම් අංක (3) හි සඳහන් ගනුදෙනුව සඳහා භාණ්ඩ ගැනිලි වෙනුවට මුදල් ගැනිලි ලෙස සලකමින් ගිණුම්කරණ සමීකරණයෙහි මුදල් යටතේ ගැලපීම් කර තිබුණි.

(4) අයිතම් අංක (4) හි සඳහන් රු.5,000/- ක් වූ දුරකතන බිල සඳහා රු.4,000/- ක් පමණක් ගෙවීම සඳහා බොහෝ පිරිසක් වැරදි උත්තර සපයා තිබුණි. සමහරු උපචිත දුරකතන ගාස්තුව වූ රු.1,000/- නොසලකා හැර ගෙවූ රු.4,000/- පමණක් සටහන් කර තිබුණි. තවත් සමහරු මාසයේ දුරකතන බිල් ගාස්තුව වූ රු.5,000/- වියදමක් ලෙස සලකා ස්කන්ධයෙන් (හිමිකම්) වලින් - 5,000 වශයෙන් සටහන් කර නොතිබුණි.

(5) ගනුදෙනු අයිතම් අංක 5 හි සඳහන් රු.200,000/- ක් පිරිවැය වූ භාණ්ඩ රු.220,000/- කට ණය පදනම මත විකිණීම සමහරු අත්පිට විකුණුමක් ලෙස සලකා තොග තීරයේ -200,000 ක් සහ මුදල් තීරයේ +220,000 ක් වශයෙන් ද හිමිකම් (ස්කන්ධය) තීරයේ +20,000 ක් ලෙසද සටහන් කර තිබුණි.

**(B) <u>දෛනික විකුණුම් පොත පිළියෙල කිරීම</u>**

(1) සමහර අයදුම්කරුවන්ට දෛනික විකුණුම් පොතේ මූලික ආකෘතිය පිළිබඳ අවබෝධයක් නොමැති බව දක්නට ලැබුණි. නියමිත ආකෘතියෙන් පරිබාහිර වූ ක්‍රමවලට සමහරු උත්තර සපයා තිබුණි.

(2) වෙළෙඳ වට්ටම් අඩු කිරීම පැහැදිලිව විකුණුම් පොතේ පෙන්නුම් කළ යුතු වුවද වැඩි පිරිසක් වෙළෙඳ වට්ටම් අඩුකළ පසු ලැබෙන අගය පමණක් එහි සටහන් කර තිබෙනු දක්නට ලැබුණි.

(3) වෙළෙඳ වට්ටම් අදාල වන්නේ ගනුදෙනු අංක (2) ට පමණක් වුවද සමහරු සියලුම විකුණුම්වලට එම වෙළෙඳ වට්ටම් අදාල කරගෙන තිබෙනු දක්නට ලැබුණි.

## C - කොටස

**ප්‍රශ්න අංක 06 - ලකුණු 20**
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

කේවලස්වාමි ව්‍යාපාරයක අවසාන ගිණුම් පිළියෙල කිරීම පිළිබඳ අවබෝධය මැන බැලීම සඳහා මෙම ප්‍රශ්නය ඉදිරිපත් කර ඇති අතර එය (a) සහ (b) වශයෙන් කොටස් දෙකකින් සමන්විතය. (a) කොටසින් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය පිළියෙල කිරීම පිළිබඳවද (b) කොටසින් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙල කිරීම පිළිබඳවද අවබෝධය පරීක්ෂාවට ලක්කර ඇත. සපයා ඇති උත්තර අනුව උත්තර පත්‍ර පරීක්ෂා කිරීමේදී පොදුවේ දක්නට ලැබුණු පොදු දුර්වලතා පහත දැක්වේ:

**(a) <u>විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය පිළියෙල කිරීම</u>**

(1) විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ ඇතුලත් කළ යුතු අයිතම් පිළිබඳ සමහරුන්ට අවබෝධයක් නොමැතිකමින් ඉඩම්, ගොඩනැගිලි, පරිගණක සහ බෙදාහැරීමේ ලොරි රථ වැනි මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඇතුලත් කළ යුතු සටහන්ද මෙහි ඇතුලත් කර තිබෙනු දක්නට ලැබුණි.

(2) විකුණුම් කොමිස් වියදමක් වුවද සමහරු එය ආදායමක් ලෙස සලකා ආදායම් ප්‍රකාශනයේ සටහන් කර තිබුණි. එමෙන්ම බැංකු අයිරා පොලියද සමහරු ආදායමක් ලෙස සලකා සටහන් කර තිබුණි.

(3) බොහෝ පිරිසක් ඉදිරියට ගෙවූ රක්ෂණය නිවැරදිව ගලපා සටහන් කර නොතිබුණි.

(4) වෙළෙඳ ලැබිය යුතු මුදල්වලින් රු.50,000/- ක් වූ බොල්ණය ලියා හැරීම අඩුකළ පසු ලැබෙන අගයෙන් 10% ක අඩමාන ණය ප්‍රතිපාදනය කළ යුතු වුවද සමහරු එය නොසලකා හැර මුලු ලැබිය යුතු මුදල් අගයෙන් අඩමාන ණය ප්‍රතිපාදනය කර තිබෙනු දක්නට ලැබුණි.

(b) <u>මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙල කිරීම</u>

(1) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයක ඇතුලත් කළ යුතු සටහන් පිළිබඳ මූලික අවබෝධයක් නොමැතිකමින් සමහරු එහි ගැනුම්, විකුණුම්, ආරම්භක තොග සහ තවත් සමහර වියදම්ද එහි ඇතුලත් කර තිබෙනු දක්නට ලැබුණි.

(2) ඉදිරියට ගෙවූ රක්ෂණය සහ උපචිත විදුලිය, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ නිවැරදිව සටහන්කර නොමැති අවස්ථා දක්නට ලැබුණි.

(3) බොල් ණය ලියාහැරීම සහ අඩමාණ ණය ප්‍රතිපාදනය නිවැරදිව ගණනය කර නොමැති බව සමහරුන්ගේ උත්තර පත්‍රවලින් දක්නට ලැබුණි.

(4) සරල මාර්ග ක්‍රමය මත නිවැරදිව ක්ෂය ගණනය නොකිරීම සහ සමුච්චිත ක්ෂය අගයන් නිවැරදිව සටහන් නොකිරීම තුලින් සමහරු අඩු ලකුණු ලබා ඇති බව දක්නට ලැබුණි.

(5) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළිගත් ආකෘතියට අනුව පිළියෙල කර නොමැති බව දක්නට ලැබුණි.

- - -

## අයදුම්කරුවන්ගේ තේරුම් ගැනීම දියුණු කිරීමේ සැළකිල්ලට ගත යුතු සාමාන්‍ය කරුණු:

1. **විෂය නිර්දේශයේ සම්පූර්ණ කරුණු හොඳින් අධ්‍යයනය කිරීම සහ සෑම ඒකකයකින්ම හෝ අංශයකින්ම අපේක්ෂිත දැනුම් මට්ටම පිළිබඳ මනා අවබෝධයක් දියුණු කර ගැනීම.**

2. **අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය කිහිපවතාවක්ම හොඳින් කියවිය යුතු අතර, සියලුම ගණනය කිරීම්වලට අදාළ පෙර වැඩ පැහැදිලිව පෙන්වා දැක්විය යුතුය.**

3. **උත්තර සැපයීමේදී උපකල්පනයන් අදාළ වන්නේ නම්, එම උපකල්පනයන් පැහැදිලිව දැක්විය යුතුය.**

4. **අත් අකුරු පැහැදිලි විය යුතු අතර ප්‍රශ්න අංකයන් නිවැරදිව දැක්විය යුතුය. පිළිතුරු පත්‍රය භාරදීමට පෙර ප්‍රශ්න අංක නැවත පරීක්ෂා කිරීම ආදී දේ අනිවාර්ය වේ.**

5. **ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් නිවැරදිව අනුගමනය කළ යුතුය.**

6. **අවබෝධය, කුසලතා සහ පළපුරුද්ද තියුණු කර ගැනීම සඳහා පසුගිය ප්‍රශ්න ප්‍රත සහ යෝජිත පිළිතුරු උපකාරීවනු ඇත. සමාන රටාවන් සහ ව්‍යූහයන් නැවතත් ප්‍රශ්න පත්‍රයන් තුළ ඇතුළත් විය හැකි බැවින් එය සෑම විටම වාසිදායක වනු ඇත.**

7. **මෙම විෂයට අදාළව ස්ව-අධ්‍යන පොත සහ සඟරා මෙන්ම අදාළ විෂය කොටස් සඳහා අදාළවන අනෙකුත් කියවීම් පරිශීලනය කිරීම සිදු කරන්න.**

8. **කාල කළමනාකරණය විභාගයේදී ඉතා වැදගත් වේ. සෑම ප්‍රශ්නයකටම වෙන් කර ඇති ලකුණු දෙස බැලීමෙන්, පිළිතුරු සැපයීමට වැය කළ යුතු කාලය පිළිබඳ ඇස්තමේන්තුවක් කළ හැකිය.**

9. **විභාගය සමත්වීමට තිර අදිටනින් යුතුව, මනා සූදානමකින් විභාගයට පෙනී සිටීම සිදු කරන්න.**

- * * * -